# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය
த. பெ.இ 10120
2171635
Po.Box No

ෆැක්ස්
தொலைநகல 011-
Fax

දුරකථන
தொலைபேசி 011-2887973
Telephone (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம் www.Police.lk
Web Site

ඊ මේල්
மின்னஞ்சல் dir.media@police.gov.lk
E-mail


මගේ අංකය
எனது இலக்கம் 1451/ 2024
My NO

ඔබේ අංකය
உமது இலக்கம் / 2024
Your No

දිනය
திக 10/09/2024
Date පැය 1345

**මාධ්‍ය නිවේදනය**

**කූඨ ලේඛණ සකස් කිරීම සම්බන්ධ සැකකරුවන් 05 දෙනෙකු අත්අඩංගුවට - මාතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

මාතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිළධාරීන් කණ්ඩායමකට ලද තොරතුරකට අනුව ව්‍යාජ ලෙස රියදුරු බලපත්‍ර, අධ්‍යාපන සහතික, වෛද්‍ය උපාධි සහතික ඇතුළු උපාධි සහතික, රාජ්‍ය නිලධාරීන්ගේ නම් සහිත නිල මුද්‍රා කූඨ ලෙස සකස් කරන බවට ලද තොරතුරක් අනුව එම කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් 2024.09.08 වන දින මාතර වෙරළ උද්‍යානය ප්‍රදේශයේදී සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගන්නා ලද සැකකරුගෙන් සිදු කරන ලද ප්‍රශ්ණ කිරීමේදී අනාවරණය කර ගන්නා ලද තොරතුරු අනුව සිද්ධියට සම්බන්ධ තවත් සැකකරුවන් සිව් දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 32,36,40 හා 60 වයස් වල පසුවන මහරගම, කොට්ටාව, පිළියන්දල, පාදුක්ක හා කඹුරුපිටිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සිදුකරන ලද වැඩිදුර විමර්ශනයේදී සැකකරුවන් විසින් ව්‍යාජ ලෙස සකස් කරන ලද රියදුරු බලපත්‍ර 168 ක්, ලැප්ටොප් යන්ත්‍ර 01ක්, මුද්‍රණ යන්ත්‍ර 03 ක්, පරිගණකයක් හා එම උපාංග, ව්‍යාජ ලෙස සකසන ලද උපාධි සහතික, ආදායම් බලපත්‍ර, , ව්‍යාජ මුද්‍රා, ලේඛණ හා කූඨ ලේඛණ සකස් කිරීමෙන් උපයා ගන්නා ලද බවට සැකකරන රුපියල් 5000/= නෝට්ටු 30 ක් ද මහරගම හා පිළියන්දල ප්‍රදේශවලදී පොලිස් භාරයට ගෙන ඇත. මාතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය මඟින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

මෙම වැටලීමට අදාල ඡායාරූප කිහිපයක්







පොලිස් මාධ්‍ය කොට්ඨාසය.